දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla.**

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/02-05/07/2021
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2023.12.11

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ: 05 /2020 (i)

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>විධායක හා ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණයන් යටතේ අනුමත බඳවා ගැනීමේ පටිපාටි හෝ / හා සේවා ව්‍යවස්ථා අනුව විශේෂ ශ්‍රේණියට සහ පළමු ශ්‍රේණියට උසස්කිරීම සඳහා පශ්චාත් උපාධි සුදුසුකම අදාළ කර ගැනීම</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව විධායක හෝ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණයන් සඳහා අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථා අනුව එවැනි සේවා ගණයකට බඳවාගැනීම, එම සේවා ගණයේ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම හා උසස්වීම් යන අවස්ථා අතුරින් අවස්ථා එකකට වැඩි ගණනකදී පශ්චාත් උපාධියක් සුදුසුකමක් ලෙස අවශ්‍ය වන්නේ නම්, ඉහත එක් අවස්ථාවකදී නිලධරයකුගේ සුදුසුකමක් ලෙස සලකා බලන පශ්චාත් උපාධියක්, අදාළ සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවාගැනීමේ පටිපාටියේ සඳහන් විෂයය අවශ්‍යතා පූර්ණ වශයෙන් සපුරාලන්නේ නම්, පසුව එළැඹෙන කාර්යක්ෂමතා කඩඉමකදී හා / හෝ උසස්කිරීමකදී ද සුදුසුකමක් ලෙස සලකා බැලීමට බාධාවක් නොවන්නේය.

02. ඒ අනුව අංක 05/2020 දරන හා 2020.06.18 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛයේ විධිවිධාන වෙනුවට, මෙතෙක් එම චක්‍රලේඛය යටතේ ගෙන ඇති තීරණ හා ක්‍රියාමාර්ගවලට අගතියක් නොවන පරිදි, 2023.12.11 දින සිට ඉහත විධිවිධානය ක්‍රියාත්මක විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ.දයාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව